**සී/ස ජාතික ලුණු සමාගම - 2022/ 2023**

**-------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සී/ස ජාතික ලුණු සමාගමේ (“සමාගම”) 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SMEs සඳහා SLFRS) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (SMEs සඳහා SLFRS) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලටට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපල පිරියත හා උපකරණ පිළිබඳව කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයෙහි 17.2 ඡේදය පරිදි, අලිමංකඩ ලුණු ලේවායේ වටිනාකම රු.6,828,395 ක් වූ වාහන සහ උපකරණ, භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඇතුළත් කර තිබුණද, එම වත්කම් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. | 2023/24 වර්ෂයේ මූල්‍ය වාර්තාවට දේපල, පිරියත සහ උපකරණවල වටිනාකම ඇතුළත් කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව, වත්කම් උපලේඛන භෞතික සත්‍යාපන වාර්තාව සමඟ සසඳා මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | දේපල පිරියත සහ උපකරණ පිළිබඳ කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ආයතන සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 17.19 ඡේදය පරිදි වත්කම් ඇස්තමේන්තු කර ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් සම්පූර්ණයෙන්ම ක්ෂය වී තිබූ වටිනාකම රු.7,856,096ක් වූ උපකරණ සමාලෝචිත වර්ෂය තුල භාවිතා කර තිබුණි. | සම්පූර්ණයෙන් ක්ෂය වූ වත්කම 2023/24 මූල්‍ය වර්ෂයේදී නැවත තක්සේරු කිරීමට කටයුතු කර ඇත. | ප්‍රමිතිය ප්‍රකාරව වත්කම්වල ආයු කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 23.10 ඡේදය පරිදි සමාගම විකුණූ ලුණු තොගය ගැණුම්කරු විසින් ඉවත් කර ගන්නා අවස්ථාවේදී එහි වටිනාකම ආදායමට බැර කළ යුතු වුවත්, විකුණුම් ඉන්වොයිසිය සඳහා ලැබෙන මුදල සම්පූර්ණයෙන් ආදායම ලෙස මූල්‍ය ප්‍රකාශනවල | කිසිවිටෙක ගැනුම්කරුට ආපසු මුදල් ලබා නොදෙන අතර භාණ්ඩවල හිමිකාරිත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ මාරු කිරීමේදී ආදායම ලෙස පිළිගනු ලැබේ. | ප්‍රමිතිය ප්‍රකාරව ආදායම හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දක්වා තිබුණි. එම හේතුවෙන් 2021/2022 වර්ෂයේදී ආදායම ලෙස හඳුනාගැනීම හේතුවෙන් 2022/2023 වර්ෂයට අයත් රු.10,164,900 ක් ආදායමට ගෙන නොතිබීම හා 2023/2024 වර්ෂයට අයත් රු.7,500,600 ක අදායමක් 2022/2023 වර්ෂයේ ආදායමට ගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.2,664,300 කින් අඩු වී තිබුණි. | | |
| (ආ) | විගණනයේ ගණනය කිරීම් අනුව අලිමංකඩ හා මන්නාරම ලුණු ලේවායන් දෙකෙහි අවසන් තොග වටිනාකම රු.19,302,311 ක් වුවද, අවසන් ගිණුම්වල අවසන් තොගයේ වටිනාකම රු.16,939,168 ක් ලෙස ගැනීමෙන් තොගයේ වටිනාකම රු.2,363,143 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ලබන වසරේ මෙය නිවැරදි වනු ඇත | අවසන් තොග වටිනාකම නිවැරදිව ගණනය කල යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් ගිණුම් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුලත විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාගම විසින් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2023 නොවැම්බර් 01 දින එනම් මාස 05 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කරන ලදී.<br>තවද, 2023 ඔක්තොබර් 25 දින තෙක් වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී. | ගිණුම් වර්ෂයේදී මූල්‍ය කළමණාකරු ඉල්ලා අස්වීම හේතුවෙන් සමාගමට නව නිලධාරියෙකු බඳවා ගැනීමට සිදු වූ අතර එය වාර්තාව ඉදිරිපත් කිරීම ප්‍රමාද වීමට හේතු විය. ඊළඟ වසරේ මෙම ගැටළුව මඟ හරිනු ඇත. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දිනැති 01/2021 මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය යටතේ නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතෙහි 3.2 (v) ඡේදය හා මුදල් ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ 2022 | සමාගම විසින් 2022 ජුනි මස සිට 2022 දෙසැම්බර් දක්වා සියළුම නිළධාරින් සඳහා රු.5,000 ක මාසික දීමනාවක් ගෙවා තිබූ අතර එම දීමනාව නවතා 2023 ජනවාරි සිට මාස 6 ක කාලසීමාවක් සඳහා තනතුර මත රු.500 – 850 ත් අතර දෛනිකව අර්බුද | සමාගමේ යහපැවැත්ම සලකා බලා මසකට රු.5000 දීමනාවක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ලදී. , කළමනාකාරිත්වය දිරිගැන්වීමේ ප්‍රතිපත්තියක් සකස් | චක්‍රලේඛ ප්‍රකාරව දීමනා ගෙවීමට කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | අගෝස්තු 08 දිනැති පීඊඩී 04/2022 චක්‍රලේඛයේ 2.5 ඡේදය | දීමනාවක් වශයෙන් නිලධාරීන් 111 ක් සඳහා රු.10,032,098 ක් චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ගෙවා තිබුණි. | කර 2023/02/03 දින PED අනුමැතියට ඉදිරිපත් කළ අතර ඒ සඳහා අනුමැතිය ලැබෙන තෙක් ඔවුන්ගේ කාණ්ඩය මත පදනම්ව පැමිණීමේ දීමනාව ගෙවීමට 2023 පෙබරවාරි මස අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය ගෙන ඇත. | |
| (ඇ) | 2022 දෙසැම්බර් 21 දිනැති අංක 09/2022 දරන මුදල් ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ චක්‍රලේඛය | 2022 වර්ෂය සඳහා ලාභය මත ප්‍රසාද දීමනා ගෙවීමේ දී පැමිණීම , කාර්යයසාධනය හෝ වෙනත් ආකාරයේ දිරි දීමනාවක් ගෙවන ආයතන සඳහා රු.20,000 ක දීමනාවක් ගෙවිය හැකි වුවද, අලිමංකඩ හා මන්නාරම ලුණු ලේවාවල සෘතුමය නිලධාරීන් 123 ක් සඳහා රු.25,000 බැගින් ප්‍රසාද දීමනාවක් ගෙවීම හේතුවෙන් රු.615,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. | කළමනාකාරීත්වය විසින් අනුමත කරන ලද ප්‍රසාද දීමනාවෙන් ඔබ්බට ස්ථිර සේවකයින්ට කරන ලද ගෙවීම් අයකර ගන්නා ලදී. | -එම- |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 134,806,255 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ලාභය රු.109,940,047 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු .24,866,208 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේදී විකුණුම් පිරිවැය රු.51,360,478කින්, විකුනුම් හා පරිපාලන වියදම් රු. 24,344,748 කින් හා ආදායම් බදු රු. 37,013,757 කින් වැඩි වුවද, ලුණු විකුණුම් මිල පෙර වසරට වඩා වැඩි වීම නිසා විකුණුම් ආදායම රු.94,089,930 කින් වැඩි වීම හා ස්ථාවර තැන්පතු මත පොළී ආදායම රු. 36,229,522 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අලිමංකඩ ලුණු ලේවාය Common Salt Super Grade මෙ.ටොන් 825ක් මෙ.ටොන් 1ක් රු.55,000 ක මිලකට වර්ෂය තුල ගැනුම්කරුවෙකුට අලෙවි කර තිබුණි. සමාගම Common Salt Grade කිරීම ඇස් මට්ටමින් පරීක්ෂා කර බලා තීරණය කරන බැවින් එම | අනාගතයේදී ගැටලුව අවම කිරීමට ක්‍රියාමාර්ග ගනු ඇත. | ආයතනයට අලාභයක් ඇති නොවන අයුරින් නිෂ්පාදනයන් සිදුකල යුතුය. |

| | | |
|---|---|---|
| නිර්ණායකම විකුණන ලද Super Grade ලුණු සඳහා ද යොදාගෙන තිබුණි. එම හේතුවෙන් Super Grade මෙට්‍රික් ටොන් 825 හි වර්ණයේ විවිධත්වයක් පවතින බවත් (Variation of Colour), බාහිර සංඝටක ඇති බවත් (Presence of Extraneous matters ), මඩ සහ වැලි අංශු පවතින බවත් (presence of mud and Sand Particles) මිලදී ගත් ආයතනය විසින් සමාගම වෙත දැනුම් දී තිබුණි. | | |

### 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මන්නාරම ලුණු ලේවාය සඳහා සිව්වර්ණ (LLDPE) සහිත බෑග් 1,200,000 මිලදී ගැනීමට 2021 ඔක්තෝබර් 15 දින පුවත්පත් දැන්වීමක් පල කර 2021 දෙසැම්බර් මාසයේදී බෑගයක් සඳහා මිල රු. 5.08 කට එකඟ වී ආයතනයක් තෝරාගෙන තිබුණි. එසේ වුවද, ඇනවුම් ඉදිරිපත් කිරීම 2022 පෙබරවාරි මාසය දක්වා ප්‍රමාදවීම හේතුවෙන් රුපියල අවප්‍රමාණය වීම සැලකිල්ලට ගෙන බෑගයක් රු.14 ක මිලකට සැපයීමට තෝරා ගත් සැපයුම්කරු කැමැත්ත පල කර තිබියදී ටෙන්ඩරයක් ඉදිරිපත් නොකල වෙනත් සැපයුම්කරුවෙකු වෙතින් බෑගයක් රු.14 බැගින් බෑග් 500,000 ක් මිලදී ගෙන තිබුණි. ඇණවුම් ලබා දීමේ ප්‍රමාදය හේතුවෙන් සමාගමට වැඩි මිලකට බෑග් මිලදී ගැනීමට සිදු වීම හේතුවෙන් රු. 4,462,000ක අලාභයක් දැරීමටද සිදුවී තිබුණි. | COVID 19 බලපෑම හා ආර්ථික අර්බුද හේතුවෙන් අනපේක්ෂිත ලෙස ආනයනය නතර වූ අතර හිඟය හේතුවෙන් අමුද්‍රව්‍යවල මිල ඉහළ යනු ලැබිණි. එබැවින් ප්‍රදානය කරන ලද සමාගම සඳහන් කළ මිලට බෑග් සැපයීම ප්‍රතික්ෂේප කරන ලදී.<br>පිරිවැය ගණනය කිරීම සඳහා නව මිල සලකා බැලූ අතර ඒ අනුව ලුණු පැකට් මිල වැඩි කරන ලදී. වැඩි කරන ලද මිල මගින් පිරිවැය NSL මගින් ආවරණය වන බැවින් NSL සඳහා කිසිදු පාඩුවක් සිදු නොවිණි. | ප්‍රසම්පාදනයන්ට අදාල ඇණවුම් කිරීමේ කටයුතු ප්‍රමාදයකින් තොරව කල යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අයවැය දත්ත පරීක්ෂාවේදී මන්නාරම ලුණු ලේවායෙන් **Comman Salt** මෙට්‍රික් ටොන් 5,500 ක් හා අලිමංකඩ ලුණු ලේවායෙන් මෙට්‍රික් ටොන් 16,000 ක නිෂ්පාදනයක් කිරීමට ඇස්තමේන්තු කර ඇති නමුත් සත්‍ය නිෂ්පාදනය පිලිවෙලින් මෙට්‍රික් ටොන් 2,215ක් හා මෙට්‍රික් ටොන් 6,167 ක් පමණ විය. එනම් පිලිවෙලින් මෙට්‍රික් ටොන් 3,285 ක් හා මෙට්‍රික් ටොන් 9,833ක ප්‍රමාණයක් සමාගමට නිෂ්පාදනය කිරීමට නොහැකි වී තිබුණි. | COVID-19 බලපෑම, ඉන්ධන අර්බුදය සහ විදුලිය විසන්ධි කිරීම, 2021 සහ 2023 දී නිරීක්ෂණය වූ අසාමාන්‍ය දේශගුණය (එනම් අස්වැන්න නෙළන කාලය තුළ ලබා ගත් වර්ෂාපතනය සහ නිෂ්පාදන ක්‍රියාවලියට බලපෑම) ආදී හේතුන් නිසා 2020 සිට 2022 දක්වා නිෂ්පාදන අනුපාතය අඩු විය. | අයවැය ගත ඉලක්ක ලඟාකර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කල යුතුය. |